(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 420.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 නොවැම්බර් මස 18 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2758/'12

1.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුර බණ්ඩාරනායක අරමුදලෙන් වතුපිටිවල රෝහලේ ඉදිකළ ලේ බැංකුව සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම ලේ බැංකුව විවෘත කිරීමෙන් පසු නැවත වසා දමා ඇති බව පිළිගන්නේද;

(iii) වතුපිටිවල රෝහලට පැමිණෙන රෝගීන්ගේ ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි සකසා එම ලේ බැංකුව නැවත ජනතා අයිතියට පවරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3557/'13

2.
ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2006 සිට අද දක්වා,

(i) සමාගම් පනත යටතේ හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ ලියාපදිංචි කර ඇති රජයට අයත් සංස්ථා, අධිකාරී, දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සමාගම් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය සඳහා යම් පුද්ගලයකුට හෝ යම් ආයතනයකට පවරා, විකුණා හෝ භාරදී තිබේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් වෙනස්වීම්වලට විෂය වී ඇති රාජ්‍ය ආයතනවල නම් හා අදාළ වෙනස්කම් සිදු කරන ලද දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ වෙනස් කිරීම් සිදුකිරීමේ අරමුණ කවරේද;

(ii) එම වෙනස් කිරීම් සිදුකරන ලද්දේ ටෙන්ඩර්, තෝරාගැනීම් හෝ ඉල්ලීමකින් තොර යෝජනා හරහාද;

(iii) එය ලබා දුන් වටිනාකම හා එහිදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

(iv) භාරදුන් දින සිට මේ දක්වා ලැබූ ආදායම හෝ ලාභාංශ වාර්ෂික පදනමින් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4401/'13

3\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිවිරෝධී ලෙස වනාන්තරවලින් අල්ලා ගන්නා ලද අලි - ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා සහන කාලයක් ලබා දී තිබේද;

(ii) නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටින අලි - ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා රුපියල් ලක්ෂ 10ක බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට කටයුතු කරන්නේද;

(iii) එලෙස ලියාපදිංචි කිරීමේ මුවාවෙන් අලි - ඇතුන් වෙළඳාම් කිරීමක් සිදුවන බවට පරිසරවේදීන් චෝදනා කරන බව දන්නේද;

(iv) ඉහත (iii)හි සඳහන් පරිදි කටයුතු කිරීම 2009 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත, 1937 අංක 02 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය කිරීමක් බව පිළිගන්නේද;

(v) එසේ නම්, එවැනි ක්‍රියා වැළැක්වීමට කටයුතු කරන්නේද;

(vi) එලෙස කටයුතු කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4622/'13

4\.

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ තාප බලාගාරය, හම්බන්තොට වරාය, හම්බන්තොට ගුවන් තොටුපළ, හම්බන්තොට (සූරියවැව) ක්‍රිකට් ක්‍රීඩාංගණය, ත්‍රිකුණාමලය බලාගාරය සහ සාම්පූර් බලාගාරය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදුකරනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩර් නොකැඳවා ඉහත ව්‍යාපෘතිවලට අදාළ ඉදිකිරීම් විදේශීය පෞද්ගලික ආයතනවලට භාර දීමේ දී විශාල කොමිස් මුදල් ලබා ගැනීම් සිදු වී තිබේද;

(ii) චීන ණය යටතේ ක්‍රියාත්මක වන ඉහත සියලු ව්‍යාපෘතිවලට අදාළ ණය සම්බන්ධයෙන් ගිවිස ගෙන ඇති සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5103/'14

5\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් සිසුන්ගේ පාසල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීමක් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, 2013 වර්ෂයේදී හා 2014 වර්ෂයේ මේ දක්වා ලබාදී ඇති එම ශිෂ්‍යත්ව සංඛ්‍යාව කොපමණද;

(iii) එම ශිෂ්‍යත්වලාභී සිසුවෙකුට මාසිකව හිමි වන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ යුතු ආකාරය කවරේද;

(ii) එම ශිෂ්‍යත්ව ලබාදීම සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය කවරේද;

(iii) එම සිසුන් අතට ශිෂ්‍යත්ව මුදල් මාසිකව ලබාදීම සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5227/'14

6.

ගරු තිස්ස අත්තනායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014.05.12 දිනට යෙදී තිබූ "පවුල් සෞඛ්‍ය සේවා දිනය" වෙනුවෙන් ජනාධිපතිවරයාට තිළිණයක් ප්‍රදානය කිරීම සඳහා රජයේ පවුල් සෞඛ්‍ය සේවා සංගමය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා එහි සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගෙන් රු. 5000ක මුදලක් එකතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙහි සේවයේ නියුතු සමස්ත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් පරිදි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගෙන් අය කර ඇති මුළු මුදල කොපමණද;

(iv) එම මුදලින් ජනාධිපතිවරයාට ලබා දී ඇති ත්‍යාගය කවරේද;

(v) මෙවැනි තිළිණයක් ලබා දීමට රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී සංගමයේ නිලධාරිනියන් කටයුතු කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී සංගමයේ සභාපතිනියගේ නම කවරේද;

(ii) ඇය සතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5263/'14

7.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තෙල්ලිප්පලෙයි රෝහලේ සේවය කරන වෛද්‍යවරුන්ට සහ හෙදියන්ට නේවාසික පහසුකම් නොමැති බවත්;

(ii) රෝහලේ විදුලි පංකා ක්‍රියා විරහිත වීම් වැනි බොහෝ අඩුපාඩු ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තෙල්ලිප්පලෙයි රෝහලේ පවතින සියලු අඩුපාඩු සපුරාලීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5441/’14

8.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ, අලුවිහාරේ, ශ්‍රී සරණංකර පාර හා එගොඩගම පාර අතර අතුරු මාර්ගයේ, තාඹරවල්ලිය කන්දේ සිට ගලා බසින ඇළ හරහා පාලමක් ඉදිකර ඇති බවත්;

(ii) පාලමේ එක් පසකින් මාර්ගයක් තිබුණද, අනෙක් පසින් යාමට හෝ ඒමට මාර්ගයක් සකස් කර නොමැති බවත්;

(iii) එම පාලම ඉදිකිරීම සම්බන්ධව කිසිදු දැන්වීමක් / පුවරුවක් සවි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පාලමේ,

(i) ඉදිකිරීමට අදාළ සැලසුම් සකස් කළ ආයතන හෝ පුද්ගලයන් කවුරුන්ද;

(ii) ඉදිකිරීම් කවුරුන් විසින් සිදු කළේද;

(iii) වැඩ ආරම්භ කළ දිනය සහ වැඩ අවසන් කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දිග හා පළල කොපමණද;

(v) ඉදිකිරීම් සඳහා වැය කළ මුදල කොපමණද;

(vi) ඉදිකිරීම් වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදන සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී පාලම ඉදිකිරීමෙන් ජනතාවට අත් වන ප්‍රතිලාභ කවරේද;

(ii) එම පාලමට සම්බන්ධ මාර්ගයේ ඉදිරි කොටස සකස් කිරීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

(iv) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (විසිවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (නොවැම්බර් 17 දින ප්‍රගතිය)

*2.

තැපැල් සේවා අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ වාවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 6, 10, 12, 19, 21, 25, 27, 43, 44, 59 සහ 68 වගන්ති යටතේ තැපැල් සේවා අමාත්‍යවරයා විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ

එකඟතාවය ඇතිව සම්පාදනය කරන ලදුව, 2014 ජූලි 25 දිනැති අංක 1872/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.30 දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 13 දිනැති අංක 1875/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එම පනතේ 6 වැනි වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 02 දිනැති අංක 1882/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1]

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

29.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

37.

ශ්‍රී ලංකාවේ සමාජ වැඩ වෘත්තීයවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

38.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

39.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---